අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/02/02/06(i)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2021.10. 22

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**නව ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන 2014.10.23 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් අන්තර්කාලීන විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අනුමැතිය මත දීර්ඝ කිරීම සම්බන්ධයෙන් සියලුම පළාත් බලධාරීන් දැනුවත් කරමින් නිකුත් කළ මගේ අංක ED/02/29/02/02/06 හා 2018.04.09, 2018.05.24, 2020.05.18, 2020.12.09 හා 2021.05.19 දිනැති ලිපි හා බැඳේ.

02. ඒ අනුව තවමත් වෘත්තීය සමාලෝචනයට හා කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමට අදාළ කටයුතු අවසන් කොට නොමැති බැවින්, එම කටයුතු සාර්ථකව නිම කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/7/2/1(II)/2012 සහ 2021.10.06 දින දරන ලිපියෙන් 2022.10.22 දින දක්වා තවත් වසරකින් අන්තර්කාලීන විධිවිධාන දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව අන්තර්කාලීන විධිවිධාන යටතේ උසස්වීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුභවතුන්ගේ ගුරු සේවයේ උසස්වීම් කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටු කළ යුතු අතර 2022.10.22 දිනෙන් පසුව උසස්වීම් යෙදෙන සියලුම ගුරුභවතුන් තම උසස්වීම් සඳහා අදාළ කාලසීමාවන් තුළ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළ යුතු බව කාරුණිකව දන්වමි.

04. තවද මගේ අංක ED/02/29/02/02/06 හා 2021.05.19 දිනැති ලිපියේ සඳහන් අන්තර්කාලීන විධිවිධාන අවසන් වන දිනය හැර අනෙකුත් සියලුම කොන්දේසි ඒ අයුරින්ම තවදුරටත් බලපැවැත්වෙන බව වැඩිදුරටත් දන්වමි.

පී. කේ. එස්. සුභෝදිනී
අතිරේක ලේකම් (ආයතන)
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත් :

(1) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
(2) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව - කරු. දැ.ගැ.ස.
(3) ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
(4) ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
(5) ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. අ.ක.ස.
(6) අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන පරිපාලන),අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. අ.ක.ස.